# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2021

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය 2021 අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය 2021 අධ්‍යයන පොදු

**ව්‍යාපාර අධ්‍යයනය II**

32 S II

**කාලය පැය 03**

01. i. (අ) පහත සඳහන් සිදුවීම් තුල අඩංගු වන නිෂ්පාදිතය හඳුනාගන්න.

1. විවිධ සතුන්ගේ හඬවල් 300 පමණ අනුකරණය කළ හැකි සංඛ ප්‍රසංගයක් පවත්වා ප්‍රේක්ෂකයන් අමන්දානන්දයට පත්කිරීම.
2. අතිදක්ෂ පිහිණුම්කරුවෙකු වූ චමින්ද නවකයන්ට පිහිනීම පුහුණු කිරීම.
3. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සුළු ව්‍යාපාරිකයන් මුහුණදෙන ප්‍රශ්න පිළිබඳව සිදුකළ පර්යේෂණ වාර්තාවක් එළිදක්වීම.
4. වර්ෂයක් පාසා පවත්වන මහ මූකලන්යාය නව අවුරුදු උළෙල මෙවරද උත්කර්ෂවත් ලෙස පැවැත්වීම

(ආ) ව්‍යාපාරවල දැකිය හැකි ගති ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

ii. චාරුලතා තමන් සතුව පැවැති සුළු ඉතුරුම් මුදලක්ද ඉතිරිය රු. 10000 ක බැංකු ණයක්ද ගෙන විවිධ වර්ගයේ අච්චාරු නිපදවා විකිණීමේ ව්‍යාපාරයක් ඇරඹීය. ඇය සාමාන්‍යයෙන් පිරිවැයෙන් 125% පමණ මිලක් අයකරයි.

(අ) මෙම ව්‍යාපාරය ''පදනම්'' 4 ක් යටතේ වර්ගකොට දක්වන්න.

(ආ) මෙම ව්‍යාපාරය අයත්වන අංශය ශ්‍රී ලංකා ආර්ථිකය තුල සාපේක්ෂව කුමන තත්ත්වයක පසුවේද ඊට බලපෑ හේතු හතරක් දක්වන්න. (ලකුණු 04)

iii. (අ) ආර්ථිකයක පැවැත්මට ව්‍යාපාර දායකවන ආකාර 4 ක් සඳහන් කරන්න.

(ආ) ව්‍යාපාරයක නවෝත්පාදන කෙරෙහි බලපාන පරිසර සාධක 4 ක් අභ්‍යන්තර හා බාහිර පරිසර ඇසුරෙන් සඳහන් කරන්න. (ලකුණු 04)

iv. ''ප්‍රීති සංචාරකයෝ'' යනු මධ්‍යම පරිමාණයේ ප්‍රවාහන සේවා ආයතනයකි. මෙහි හිමිකරු වසර 30 කට අධික කාලයක් ප්‍රවාහන ක්ෂේත්‍රයේ නියැළුනෙකි. මෙම ආයතනය සතුව දක්ෂ රියදුරන් රාශියක් සිටින අතර ඔවුන් තෝරාගැනීමේදී අදාල තනතුර තුල අවම වශයෙන් වසර 10 ක් වත් කටයුතු කර තිබීම විශේෂයෙන් සලකා බැලීය. එහෙත් බොහොමයක් කොන්දොස්තරවරු මුදල් වංචාවට පෙළඹී ඇති අතර තම වාසිය වෙනුවෙන්ම ක්‍රියා කරයි. එමෙන්ම නිශ්චිත කාලසටහනකට අනුව ධාවනයේ යෙදීමට මෙහි සේවකයන් බොහෝ විට ක්‍රියා නොකල අතර වැඩ කරන අතරතුරේදී ඇතැම්විට මත්පැන් හෝ වෙනත් මත්ද්‍රව්‍ය භාවිතා කිරීමද හුරුවී සිටියහ. තවත් විශේෂත්වයක් වූයේ අවශ්‍ය විටෙක රියදුරන්ට කොන්දොස්තරවරුන්ගේ රාජකාරිද කොන්දොස්තරවරුන්ට රියදුරන්ගේ රාජකාරිද හොඳින්ම ඉටුකළ හැකිවීමයි. මෙම ආයතනය ධාවනයට යොදාගත්තේ නවතම මෙන්ම ඉහළ පහසුකම්වලින් හෙබි බස් රථයි.

ඉහත තොරතුරු ඇසුරින් ''ප්‍රීති සංචාරකයෝ'' ආයතනයේ ශක්තීන් හතරක් හා දුර්වලතා හතරක් හඳුනාගන්න. (ලකුණු 04)

v. (අ) සමාජ වගකීම් සම්බන්ධයෙන් ප්‍රසිද්ධ පුද්ගලයෙකු හා රටක් විසින් ඉදිරිපත් කළ නිර්වචනයක් බැගින් ලියා දක්වන්න.

(ආ) ආපනශාලාවක් විසින් සමාජය, සේවකයන්, ගණුදෙනුකරුවන් හා අයිතිකරුවන් කෙරෙහි ඉටු කරන සමාජ වගකීම් එක බැගින් සඳහන් කරන්න. (ලකුණු 04)

02. i. තරිඳුගේ නිවස අසල ගව ඝාතකාගාරයක් හා ගවමස් අලෙවිසැලක් පවත්වාගෙන යයි. මෙහිදී මරා දමන ලද ගවයන්ගේ ශරීර කොටස් අසල ඇති ලඳු කැලෑවකට බැහැර කරයි. එහි දුර්ගන්ධය නිසා අසල නිවැසියන් දැඩි අපහසුතාවයකට පත්ව තිබේ. මේ පිළිබඳව නිසි බලධාරීන්ට පැමිණිලි කළද ඔවුන් එකී පැමිණිලි භාරගැනීමට පාවා මැලිකමක් දක්වයි. ඊට හේතුව ගවඝාතකාගාර හිමියාගේ අල්ලස් ලබාදීම බව ගම්වාසීන්ට නොරහසකි. එක් අවස්ථාවක නරක් වූ මස් තොගයක් සැපයීම හේතුවෙන් පාරිභෝගිකයන් කිහිපදෙනෙකුටම නේවාසිකව ප්‍රතිකාරගැනීමට පවා සිදුවිය. එහෙත් කිසිදු මූල්‍යමය සහනයක් ලබාදීමට පවා නොපෙළඹුනි. මෙහිදී රෝගී වූ පාරිභෝගිකයන් කළ ඉල්ලීම් අකාරුණික ලෙස ප්‍රතික්ෂේප කෙරුණි.

(අ) ඉහත සිදුවීම තුල දැකිය හැකි කඩවුනු පාරිභෝගික අයිතිවාසිකම් දෙකක් සඳහන් කරන්න.

(ආ) පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂාකර ගැනීමට පාරිභෝගිකයන් විසින් ක්‍රියාකළයුතු ආකාර හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

ii. (අ) ''හවුලේ කැඳවත් එපා'', ''හවුල් නම් අවුල්'' යනාදී මතයන් තවමත් ඇතැම් පුද්ගලයන් තුල මුල්බැස ඇත. එසේ නම් හවුල් ව්‍යාපාර ඇරඹීම තාර්කික නොවිය හැක. මේ පිළිබඳ ඔබ දරණ මතය කුමක්ද? එම මතය සනාථ කිරීමට කරුණු ඉදිරිපත් කරන්න.

(ආ) කිසිදු නීතිමය බලපෑමක් නොමැති වීම තනි ව්‍යාපාරයක ඇති ප්‍රධානතම වාසියකි. මෙම අදහසට ඔබ එකඟවන්නේද? පිළිතුර සනාථ කිරීමට කරුණු ඉදිරිපත් කරන්න.

(ලකුණු 04)

iii. (අ) ආර්ථිකය තුල වැඩි වශයෙන් දක්නට ලැබෙන ව්‍යාපාර වර්ගය තනි ව්‍යාපාර වූවත් තනි ව්‍යාපාරයකට සාපේක්ෂව සමාගමක් පැතිකඩ කීපයකින් රටකට වැදගත් වේ. මෙම ප්‍රකාශය සනාථ කිරීමට කරුණු හතරක් ඉදිරිපත් කරන්න.

(ආ) සමාගමක සංස්ථාපන සහතිකය තුල ඇතුලත් වන කරුණු හතරක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 04)

iv. හවුල් ව්‍යාපාර, සීමිත පෞද්ගලික සමාගම් හා සමූපකාර යන ව්‍යාපාර සංවිධාන ත්‍රිත්වය සම්බන්ධයෙන් එකිනෙකට වෙනස් වූ ලක්ෂණ හතරක් දක්වන්න. (ලකුණු 04)

v. (අ) ව්‍යාපාර සංයෝජනය වීම් සිදුවිය හැකි දෙයාකාරයකි. ඉන් එක් ආකාරයක් වන්නේ ඒකාබද්ධවීමය. මෙයද සිදුවිය හැකි දෙයාකාරයකි. එම දෙයාකාරය සඳහන් කරන්න.

(ආ) වරලත් හිමියෙකු විසින් වරලත් ලාභියෙකුට සපයන පහසුකම් හතරක් දක්වන්න.

(ලකුණු 04)

03. i. ආයතනයක දියුණුව වෙනුවෙන් කළමනාකරුවන් දක්වන දායකත්වය අතිමහත්ය. වෘත්තීය නිපුණත්වයක් නොමැති කළමනාකරුවන් සිටින ආයතනයකට වඩා වෘත්තීය නිපුණත්වයකින් හෙබි කළමණාකරුවන් සිටින ආයතන තරගයෙන් ඉදිරියට යැම තුළින් ඒබ ව තහවුරු වේ.

''මේ අනුව ව්‍යාපාරයක ප්‍රගතිය කෙරෙන බලපාන වැදගත්ම පුද්ගලයා කළමනාකරු බව කිවහැකිය.'' මෙම ප්‍රකාශය විමසන්න. (ලකුණු 04)

ii. චතුර විදේශ රැකියාවක නියැලී රුපියල් කෝටි දෙකක පමණ මුදලක් උපයාගෙන මෑතකදී ලංකාවට පැමිණියෙකි. ඔහු සිතන්නේ තව දුරටත් රැකියාවක් වෙනුවෙන් නොවෙහෙසී ව්‍යාපාරයක් ඇරඹීම වඩාත් උචිත බවයි. ඒ සඳහා තමා උපයා ඉතිරිකරගත් මුළු මුදලම වුවද යෙදීමට ඔහු කැමැත්තෙන් සිටී. ඔහු ව්‍යාපාර කටයුතු කෙරෙහි සෑම විටම ධනාත්මකව සිතයි. ඔහුගේ චරිත ලක්ෂණයක් වන්නේ යම් කාර්යකට යොමු වුවහොත් එය අවසානය දක්වාම දිරියෙන් යුතුව කරගෙන යාමයි. කුඩාකල සිට සමවයස් යහළුවන්ට වඩා බොහෝ දෑ වෙනස් ආකාරයකට දකින, සිතන හා ක්‍රියාකරන ගතියක් ඔහුතුල පැවතුනි. චතුරගේ යහළුවන් නිතර ඔහු පිළිබඳ පවසන දෙයක් වන්නේ ''බැරි දෙයක් නැති මිනිහෙක්'' යන්නයි. චතුරගේ නිවෙස අසලින් ගලායන සුන්දර අතු ගංගාවක් තිබෙයි. එබැවින් ඔහු ඒ ආශ්‍රිතව වැලි ගොඩ දැමීමේ ව්‍යාපාරයක්, ධීවර ව්‍යාපාරයක් හෝ උත්සවශාලාවක් ඇරඹීමේ විකල්ප අතර සලකා බැලීමක් කරමින් සිටී.

ඉහත සිද්ධිය ඇසුරින් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

(අ) චතුර තුල දක්නට ලැබෙන ව්‍යවසායකත්ව ගුණාංග හතරක් දක්වන්න.

(ආ) චතුර ඇරඹීමට සිතන විකල්ප ව්‍යාපාර සැලකිල්ලට ගෙන ඊට එරෙහිව ජනිත විය හැකි සාධක හතරක් දක්වන්න. (ලකුණු 04)

iii. (අ) අගරු වූ චෙක්පත් කිහිපයකට යොදා තිබූ අගරු සටහන් කිහිපයක් පහත දැක්වේ.

a. ආවරණය ලැබී නොමැත
b. අරමුදල් බන්ධනය කර ඇත
c. විධිවිධාන ඉක්මවා ඇත
d. අයහපත් නිශ්කාශනය වී නොමැත

මෙම සටහන් යොදන්නේ කුමන හේතුවක් මත චෙක්පත් අගරු වූ විටද යන්න සඳහන් කරන්න.

(ආ) පහත සඳහන් අවස්ථාවලදී චෙක්පතක් රේඛනය කරන විට ඒ තුල දැක්විය යුතු සම්මත වගන්ති ලියා දක්වන්න.

a. පුද්ගලයෙකු විසින් ලබාගත් සේවාවක් සඳහා ගෙවිය යුතු මුදල අවිනිශ්චිත නමුත් එම මුදල රු.50,000/- නොයික්මවන බව ඔහු දනී. සේවා සැපයුම්කරු වෙතට මෙම පුද්ගලයා අණකරු ලෙස චෙක්පතට සිය අත්සන යොදා හිස් චෙක්පතක් ලබාදෙන විටෙක.

b. තවදුරටත් පැවරිය නොහැකි ලෙස චෙක්පතක් ලබාදිය යුතු විටෙක.

c. පැවරුම්කරුට වඩා වැඩි අයිතියක් පැවරුම්ලාභියාට හිමි නොවිය යුතු යැයි අදහස් කරන විටෙක

d. චෙක්පතෙහි නම සඳහන් තැනැත්තාගේ නමින් ලංකාබැංකුවෙහි ඇති ඕනෑම ශාඛාවක ඇති ගිණුමකට බැරකළ හැකි විලස චෙක්පත ලබාදීමට අවශ්‍ය විටෙක (ලකුණු 04)

iv. (අ) විද්‍යුත් මුදල් මගින් ගෙවීම් කිරීම පහසු කිරීම සඳහා යොදාගන්නා ක්‍රම හතරක් නම් කරන්න.

(ආ) ''අන්තර්ජාල බැංකු කටයුතු'' යටතේ බැංකුවක් විසින් ගණුදෙනුකරුවන්ට සැපයෙන සේවා හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

v. (අ) ''උපරිම විශ්වාසය'' යනු රක්ෂණ ගිවිසුමක් ආරම්භයේ සිට අවසානය දක්වා එකසේ රැකගත යුතු වැදගත් මූලධර්මයකි. මේ සඳහා රක්ෂකයා හා රක්ෂිතයා යන දෙපාර්ශවයම රක්ෂණයට ලක්කරන විෂය වස්තුවට අදාල වැදගත් කරුණු නොසඟවා හෙළිදරව් කරගත යුතුය.

රක්ෂණ ගිවිසුමකට එළඹීමේදී සාමාන්‍යයෙන් රක්ෂකයා විසින් හෙළිදරව් කළ යුතු වැදගත් තොරතුරු හතරක් සඳහන් කරන්න.

(ආ) සුභාෂ් මහතා මිලදීගත් කාර් රථයේ වටිනාකම රු. 5,000,000/- කි. ඔහු විසින් මෙය A සහ B යන රක්ෂණ ආයතන දෙකෙහි පිළිවෙලින් රු. 4,000,000 කට හා රු. 3,000,000 කට රක්ෂණය කරන ලදී. සුභාෂ් සිය රථයේ ගමන්කරමින් සිටියදී අපරීක්ෂාකාරීව විරුද්ධ පසින් ආ මෝටර් රථයක ගැටීම නිසා ඔහුගේ රථයට හානිවිය. හානියේ තරම රු. 140,000 බව ඇස්තමේන්තු කෙරිනි.

1. මෙහිදී වන්දිගෙවීම සිදුවන්නේ කවර රක්ෂණ මූලධර්මයට අනුකූලවද?
2. එක් එක් ආයතනය වෙතින් සුභාෂ්ට හිමිවන වන්දිමුදල කොපමණ ද?

(ලකුණු 04)

04. i. (අ) ඉහළ මට්ටමේ කළමනාකරුවෙකු සතුව තිබිය යුතු සංකල්පනාත්මක කුසලතා 04 ක් නම් කරන්න.

(ආ) සඵලදායී නායකයෙකුගේ කාර්යයන් 4 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

ii. (අ) ව්‍යාපාරික සංවිධානයකට ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ ආචාරධර්මීය හැසිරීම ඉතා වැදගත් වන්නේ ඇයි?

(ආ) පහත දැක්වෙන ව්‍යාපාරික සංවිධානවලට වඩාත් ගැලපෙන දෙපාර්තමේන්තු කරන පදනම් මොනවාද?

1. ඇඟළුම් නිපදවන ආයතනයක්
2. වාණිජ බැංකුවක්
3. සංවර්ධන බැංකුවක්
4. රෝහලක්

(ලකුණු 04)

iii. වාණිජ බැංකුවකට අදාලව රේඛීය කාර්යයන් සහ මාණ්ඩලික කාර්යයන් 04 බැගින් සඳහන් කරන්න. (ලකුණු 04)

iv. (අ) සංවිධානයක් සඳහා පාලන පද්ධතියක් නිර්මාණය කිරීමේදී සැලකිල්ලට ගනු ලබන සාධක 4 ක් සඳහන් කරන්න.

(ආ) බලතල පැවරීමකදී සැලකිය යුතු සාධක 4 ක් දක්වන්න. (ලකුණු 04)

v. ආයතනයක සුපරීක්ෂණය මගින් කෙරෙන පාලනය සඵලවත් වීම සඳහා ඉටුවිය යුතු කරුණු සඳහන් කරන්න. (ලකුණු 04)

05. i. සී/ස පුන්සඳා සමාගම රූපලාවන්‍ය වෙළෙඳපොළේ වසර 40 ක පළපුරුද්දක් සහිත ආයතනයකි. දැනට මෙම සමාගම කාන්තාවන් සඳහා විවිධ වූ සබන් වර්ග, රූපලාවන්‍ය ක්‍රීම් වර්ග හා ෂැම්පු වර්ග නිෂ්පාදනය කරයි. පසුගිය කළමනාකරණ රැස්වීමේදී සමාගමේ කටයුතු තවදුරටත් විවිධාංගීකරණය කිරීමේ වැදගත්කම පිළිබඳව සාකච්ඡා කෙරිණි. පිරිමින්ගේ රූපලාවන්‍ය වෙළෙඳපොළ දැනට ලෝකයේ වර්ධනය වන වෙළෙඳපොළකි. එහෙත් පිරිමින්ට අවශ්‍ය රූපලාවන්‍ය ද්‍රව්‍ය නිපදවීමට මැනවින් නවීකරණය වූ පහසුකම් ශ්‍රී ලංකාව තුළ නැත. වර්තමානය වන විට තරගකරුවන්ගේ ප්‍රබල ප්‍රචාරණයට මුහුණදීමට අවශ්‍ය මුදල් සම්පාදනය සඳහා බැංකු ණයක් ගැනීමට ආයතනය සූදානම් වෙයි.

(අ) මෙම ආයතනය සම්බන්ධයෙන් ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන 1 බැගින් සඳහන් කරන්න.

(ආ) මෙම සමාගමේ උන්නතිය සඳහා අනුගමනය කිරීමට වඩා සුදුසු අලෙවිකරණ දර්ශනය ලෙස ඔබ යෝජනා කරන්නේ කුමක්ද? ඊට හේතුව කුමක්ද? (ලකුණු 04)

ii. (අ) නිෂ්පාදිත මිශ්‍රය වඩාත් උචිත එකක් වීමට ඒ තුළ පැවතිය යුතු ලක්ෂණ මොනවාද?

(ආ) ආකාර තරඟය සහ පොදු තරඟය අතර වෙනස කුමක්ද? (ලකුණු 04)

iii. (අ) ළමා චිත්‍රපට නිෂ්පාදකයෙකු හා සතිඅන්ත සාමාන්‍ය පුවත්පත් නිෂ්පාදකයෙකු අනුගමනය කරන අලෙවිකරණ ක්‍රමයේ ඔබ දකින වෙනස කුමක්ද?

(ආ) නිෂ්පාදන සංකල්පය හා අලෙවිකරණ සංකල්පයේ ඔබ දකින වෙනස්කම් දෙකක් දක්වන්න. (ලකුණු 04)

iv. (අ) එක්තරා ද්‍රව්‍ය අයිතමයකට අදාළ තොරතුරු කිහිපයක් පහත දැක්වේ

- ද්‍රව්‍ය පාරිභෝජනය කාර්තුවකට ඒකක 1800
- ඒකකයක පිරිවැය රු. 50
- එක් ඇනවුමකට වැයවන පිරිවැය රු. 200
- ගබඩා කිරීමේ වාර්ෂික පිරිවැය - ඒකක පිරිවැයෙන් 4%

මෙම ද්‍රව්‍ය අයිතමයට අදාල ආර්ථික ඇණවුම් ප්‍රමාණය ගණනය කරන්න.

(ආ) ආර්ථික ඇණවුම් ප්‍රමාණය තීරණය වන අවස්ථාවේදී පිරිවැයෙහි හැසිරීම පිළිබඳ කරුණු දෙකක් ලියන්න. (ලකුණු 04)

v. (අ) ප්‍රවාහ නිෂ්පාදනයට සාපේක්ෂව කාර්යය නිෂ්පාදනයේ වාසි දෙකක් ලියන්න.

(ආ) ක්‍රියාවලි පිරියත සහ ස්ථාවර ස්ථානීය පිරියත භාවිතා වන සේවා නිෂ්පාදිත සඳහා නිදසුන බැගින් දෙන්න. (ලකුණු 04)